# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,084 - 2018 අගෝස්තු මස 10 වැනි සිකුරාදා - 2018.08.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | 1224 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥානත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 අගෝස්තු මස 31 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 අගෝස්තු 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# තනතුරු - ඇබෑර්තු

## සංශෝධනයයි

## අක්මීමන ප්‍රාදේශීය සභාව

2018.07.20 වැනි දින පළ කරන ලද අංක 2081 දරන *ගැසට්* පත්‍රයේ IV (ආ) කොටස තනතුරු - ඇබෑර්තු යටතේ, 07 - 497 නිවේදනයේ පුස්තකාල සහායක තනතුරු සංඛ්‍යාව 01 ලෙස වැරදියට මුද්‍රණය වී ඇත. එම තනතුරු සංඛ්‍යාව 02 ක් ලෙස සංශෝධනය විය යුතුය.

බී.ජී. බන්දුල,
ලේකම්,
අක්මීමන ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 25 වැනි දින,
අක්මීමන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

08 - 417

---

## කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව

කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුර සඳහා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

පුරප්පාඩු පවතින තනතුර හා ඒ පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *මාසික වැටුප් පරිමාණය* | *අවම අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| 01. ජල වැද්දුම්කරු (III ශ්‍රේණිය) | 01 | රා.ප.ච. 3/2016 අනුව PL2-2016 වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හය (06) ක් සමත්වී තිබිය යුතුය. අදාළ තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q.) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුනතාවක් ලබා තිබීම හා අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ. |

*පොදු සුදුසුකම් :*

I. අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.

II. අයදුම්කරු බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. පදිංචි වසමේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද සහතිකය මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතු ය.

III. සෑම අපේක්ෂකයෙකුම දකුණු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

IV. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතු ය.

V. අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවෙකු කරනු ලැබුවෙකු හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු ය.

VI. තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

*බඳවාගැනීමේ ක්‍රමය :*

I. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් පසුව තෝරා ගනු ලබන අතර, එම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගන්නා ලකුණු පදනම් කර ගනිමින් බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

II. නියමිත සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

I. මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය.

II. වැන්දඹු හා අනත්දරු අරමුදලට දායකත්වය හිමි වේ.

III. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වන අතර, වසර තුන (03) අවසානයේ වැඩ, පැමිණීම හා හැසිරීම යහපත් තත්ත්වයක සිටින සේවකයන් ට පමණක් ස්ථිර පත්වීම් ප්‍රදානය කරනු ලැබේ. එමෙන්ම වසර තුනක සේවා කාලය අවසන් වීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩ ඉම සමත් විය යුතු ය.

IV. මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, රජයේ හෝ දකුණු පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම සේවකයින් බැඳී සිටියි.

*ඉල්ලුම් කළයුතු ආකාරය :*

අයදුම්කරු මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරන ලද අයදුම්පතක් 2018.09.10 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, ප්‍රාදේශීය සභාව, කඹුරුපිටිය." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුයි. අසම්පූර්ණ අයදුම්පත් හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම පූර්ණ බලතල කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ.

අයදුම්පත සමග පහත සහතිකවල පිටපතක් ඇමිණිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

I. උප්පැන්න සහතිකය;

II. අධ්‍යාපන සහතික;

III. පදිංචිය සහතික කිරීම පිණිස මෑතක දී ලබාගත් ග්‍රාම නිලධාරි සහතකිය, (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර තිබිය යුතු ය.);

IV. මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්;

V. පළපුරුද්ද පිළිබඳ සහතිකය;

VI. කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් සේවා සහතිකයක්.

බී. රම්‍යලතා,
ලේකම්,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 24 වැනි දින,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ දී ය.

........................................................................................ තනතුර සඳහා අයදුම් පත්‍රය

01. අයදුම්කරුගේ නම (මුලකරු සමග නම) :__________________________________.

02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :__________________________________.

03. තැපැල් ලිපිනය :__________________________________.

04. දුරකථන අංකය :__________________________________.

05. උපන් දිනය : වර්ෂය: ☐☐☐☐ මාසය: ☐☐ දිනය: ☐☐

06. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

07. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු : අවුරුදු: ☐☐ මාස: ☐☐ දින: ☐☐

08. ස්ත්‍රී පුරුෂ භාවය :__________________________________.

09. විවාහක/අවිවාහක බව :__________________________________.

10. ජාතිය :__________________________________.

11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද, ලියාපදිංචි වීමෙන් ද යන වග:________________________

12. අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස. (සා.පෙළ) විභාගය -

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| ........................................... | ................................ | ........................................... | ................................ |
| ........................................... | ................................ | ........................................... | ................................ |
| ........................................... | ................................ | ........................................... | ................................ |
| ........................................... | ................................ | ........................................... | ................................ |
| ........................................... | ................................ | ........................................... | ................................ |

13. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :__________________________________.

14. ඔබ දැනට කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් :

I. දැනට දරන තනතුර :__________________________________.

II. එම තනතුරට පත් වූ දිනය :__________________________________.

III. එම පත්වීමේ ස්වභාවය :__________________________________.

(ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත්/ඇස්තමේන්තුගත පදනම් මත ද) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත් ඒවා බව මෙමගින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

________________________

අයදුම්කරුගේ අත්සන.

දිනය :____________________.

08 - 475

## අම්බලන්ගොඩ නගර සභාව

### දකුණු පළාත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු

අම්බලන්ගොඩ නගර සභාවේ දැනට පුරප්පාඩු වී පවත්නා පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති දකුණු පළාත් සභා බල ප්‍රදේශය තුල ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම් හා බඳවා ගැනීමේ ක්‍රමය* |
|---|---|---|---|---|
| 01. | පුස්තකාල සහායක | 01 | PL 1-2016<br>රු. 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 - රු. 36,410.00<br>(රා. පරි. ච. ලේ. 3/2016 ප්‍රකාරව ගැලපීම් කරනු ලැබේ.) | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හය (06)ක් සමත් වී තිබිය යුතු ය. |

*බඳවා ගැනීමේ පොදු සුදුසුකම් : -*

1. අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
2. අයදුම්කරු විශිෂ්ය චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යකින් යුක්ත විය යුතු ය. පත්වීම සඳහා තෝරා ගත හොත් මසක් ඇතුලත රජයේ වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂාවේදී නුසුදුස්සකු වශයෙන් පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.
3. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු. 18-45ත් අතර විය යුතු ය. (ස්ථිර තනතුරක සිටින අභ්‍යන්තර අයදුම්කරුවෙකුට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)
4. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය. පදිංචි වසමේ ග්‍රාම නිළධාරි විසින් නිකුත් කරන ලද සහතිකය මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතු ය.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී හෝ රජයේ හෝ රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූ අයෙකු නොවිය යුතු ය.

*සේවා නියුක්ත කිරීමේ කොන්දේසි :-*

1. සුදුසුකම් පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදීම සිදු කෙරේ. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ පූර්ණ අනුමැතිය ලත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

   සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙන ක්ෂේත්‍රයන් සහ ලකුණු ප්‍රමාණයන් :

| | *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. | අධ්‍යාපන සුදුසුකම් | 30 | 50% |
| 2. | අමතර සුදුසුකම් | 10 | |
| 3. | පළපුරුද්ද | 10 | |
| 4. | සභා බල ප්‍රදේශය තුළ පදිංචිය | 45 | |
| | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |
| | එකතුව | 100 | |

2. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය සම්බන්ධයෙන් රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ වලට යටත් විය යුතු ය.
3. වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.
4. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.
5. මෙයට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයට සහ මුදල් රෙගුලාසි වලට ද, දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝග වලට ද, වරින් වර දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන රෙගුලාසි වලට හා නියෝග වලට ද අනුකූලව සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.
6. මෙම ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබීම කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.
7. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර තුර කාල සීමාවේදී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය අම්බන්ගොඩ නගර සභාවේ ගරු සභාපති සතු ය.

*අයදුම්පත් ඉදිරිපත් කිරීම*

1. මෙම නිවේදනයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය. (අයදුම්පත්‍රය A4 ප්‍රමාණයට සකස් කළ යුතු ය.) අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ, අපැහැදිලි, මෙන්ම නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිඳු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.
2. සම්පූර්ණ කරන ලද අයදුම්පත් පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් ද සමගින් 2018 සැප්තැම්බර් මස 10 වැනි දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් ලේකම්, නගර සභාව, අම්බලන්ගොඩ යන ලිපිනයට එවිය යුතු ය.

(අ) උප්පැන්න සහතිකය,
(ආ) අධ්‍යාපන සහතිකය,
(ඇ) මෑතකදී ලබා ගත් චරිත සහතික 02 ක්,
(ඈ) පදිංචිය සනාථ කිරීමට ප්‍රාදේශීය ලේකම් සනාථ කළ ග්‍රාම නිලධාරි සහතිකය,
(ඉ) වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද තිබේ නම් ඒ බව සනාථ කෙරෙන සහතික,
(ඊ) සේවා සහතිකය.

**සැළකිය යුතු යි:-**

දැනට රාජ්‍ය සේවයේ නියුතු වුවත් තමන්ගේ අයදුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශ මත එවිය යුතු ය. අයදුම්පත් සමග එවන සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතු ය.

සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

2018ක් වූ ජූලි මස 19 වැනි දින,
අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

යොමු අංකය -
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ අයදුම්පත්‍රය**

අම්බලන්ගොඩ නගර සභාව

.................................................. *තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :——————————————.
02. මුලකුරු සමග නම :——————————————.
03. ස්ථිර ලිපිනය :——————————————.
04. ජාතික හැඳුනුම්පත් අංකය :——————————————.

05. උපන් දිනය : වර්ෂය :—————— මාසය :—————— දිනය :——————
06. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :——————————————.
07. ජාතිය :——————————————.
08. ආගම :——————————————.
09. විවාහක/ අවිවාහක බව :——————————————.
10. ස්ත්‍රී/ පුරුෂ භාවය :——————————————.
11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද ? එසේ නම් ඒ පරම්පරාවෙන් ද ? ලියාපදිංචි වීමෙන්ද යන වග :——————————————.
12. දකුණු පළාත් සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි කාලය :——————————————.
13. අධ්‍යාපන සුදුසුකම් :——————————————.

(I) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ඃ

| විෂයයන් | සාමාර්ථය | විෂයයන් | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

14. ඔබ ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම :——————————————..
15. වෙනත් සුදුසුකම් :——————————————.
16. සේවා පළපුරුද්ද :——————————————.
17. ඔබ කවරදාක හෝ චෝදනාවක් ලැබ උසාවියකින් වරදකරුවකු වී තිබේ ද ? :——————————————.

ඉහත සඳහන් කරන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. සාවද්‍ය තොරතුරු සපයා තිබුණහොත් සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ පසුව අපේක්ෂත්වය අවලංගු වන බවත් තෝරා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දන්වමි.

——————————.
අයදුම්කරුගේ අත්සන.

**රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා**

ඉහත නම සඳහන් ................................ මයා දැනට මෙම ආයතනයේ ................................ වශයෙන් සේවය කරයි. ඔහු/ඇය මෙම තනතුරට තෝරාගත හොත් සේවයෙන් නිදහස් කළ හැකි ය./ නොහැකිය. ඔහු/ඇය විනයානුකූල දඬුවමකට ලක් වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————————.
දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානියාගේ අත්සන

නම :——————————————.
පදවි නාමය :——————————————.
දෙපාර්තමේන්තු / ආයතනය :——————————————.
(නිල මුද්‍රාව තබන්න)
දිනය :——————————.

08-474

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.